# තනතුරු පුරප්පාඩු

## සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ පහත සඳහන් තනතුරෙහි පවතින පුරප්පාඩුව පිරවීම සඳහා ශ්‍රී ලාංකික අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**කළමණාකරු - සැලසුම්**

**වැටුප් පරිමාණය** : MM 1-1 - 2006 Rs. 25,640.00 - 3x665-7x735-15x925 - 46,655.00
MM 1-1 - 2016 Rs. 53,175.00 - 10x1375-15x1910 - 95,575.00

(වැටුපට අමතරව රජයේ අනුමත දීමනා සහ ආයතනය වෙතින් දෙනු ලබන දීමනා ගෙවනු ලැබේ.)

**මූලික අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය පළපුරුද්ද**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිලිගත් විශ්වවිද්‍යාලයක ආර්ථික විද්‍යාව/ වාණිජ / ව්‍යාපාර කළමනාකරණය / රාජ්‍ය පරිපාලනය විෂයයන්ගෙන් උපාධියක් ලබා තිබීම.

සහ

ඉහත සුදුසුකම් ලබා ගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ වසර 03 ක පළපුරුද්ද.

**වයස**

2016.12.27 දිනට අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

අදාළ තනතුරට පැවරෙන විෂය ක්ෂේත්‍රයට අදාළ කනිෂ්ඨ කළමනාකාර සේවා ගණයේ I ශ්‍රේණියේ වසර පහක (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වෙනත්,**

**සෑම ඉල්ලුම් කරුවෙක්ම,**

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(ii) තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

(iii) විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

**බඳවා ගැනීමේ ක්‍රමය :**

පත්වීම් බලධාරියා විසින් පත් කෙරෙන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගැනීමේ පටිපාටියට අනුව බඳවාගනු ලැබේ.

පත්වීම්ලාභීන් සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. සේවා යෝජකයාගෙන් 12% කි. සේවකයාගෙන් 8% කි. සේවා යෝජකයාගෙන් පත්වීම් ලාභියාගේ වැටුපෙන් 3% ට සමාන මුදලක් සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලට ගෙවනු ලැබේ.

රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල වල සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත් ස්වකීය අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමුකළ යුතුය. අයදුම්කරුවන්ගේ සම්පූර්ණ ජීව දත්ත සහ අදාළ සහතික වල, සහතික කරන ලද ඡායා පිටපත් අයදුම් පතට අමුණා තිබිය යුතුය. සහතික වල පිටපත් අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

තමා විසින් පිලියෙල කරගත් අයදුම්පතක් සභාපති, ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව, 08 වන මහල, අංක 464 දරන ගොඩනැගිල්ල, ටී.බී. ජයා මාවත, කොළඹ 10 යන ලිපිනයට 2016.12.27 දින හෝ එදිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඔබගේ දුරකථන අංකය හා ඔබ ගැන විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ ලිපිනයන් සහ දුරකථන අංකයන් අයදුම්පතෙහි සඳහන් කර තිබිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ ඉහළ වම් කෙළවරේ ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

තැපෑලේදී අස්ථානගතවන හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් පිලිබඳ අප සංස්ථාව වගකියනු නොලැබේ.

**සභාපති,**
**ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව,**
**08 වන මහල,**
**අංක 464 දරන ගොඩනැගිල්ල,**
**ටී.බී. ජයා මාවත,**
**කොළඹ 10.**

**දු.ක.අ. 011-2689735**